**ශීර්ෂය 7 - අධිකරණ සේවා කොමිෂන් සභාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කර තිබූ භාණ්ඩ හා උපකරණ අයිතම 9 ක පිරිවැය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙන් ඉවත් කර නොතිබුණි. | වෙන්දේසි කරන ලද භාණ්ඩ හා උපකරණවල පිරිවැය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (ACA-6) අපහරණයන් ලෙස ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කළ යුතු වේ. |

### 1.6.2 අග්‍රිම ශේෂ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාරයට පියවන ලද නමුත් භාණ්ඩාගාර සටහන්වල ඇතුළත් රු.33,086 ක අග්‍රිම ශේෂය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2020 හි 4.1 ප්‍රකාරව මුදල් පොතෙහි පැවති රු.33,086 ක අග්‍රිම ශේෂ 2020 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරය වෙත පියවා මුදල් පොතෙහි ශේෂය ශුන්‍ය කර ඇත. එබැවින් උක්ත මුදල 2020 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අප සතු අග්‍රිම ශේෂයක් නොවන බව අවධාරණය කරන අතර පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූල වෙමින් එම මුදල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සඳහන් කර නොමැත. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු අතර භාණ්ඩාගාරයට පියවා තිබුණද භාණ්ඩාගාර සටහන් වල ශේෂය පෙන්වන බැවින් ගිණුම්වල දැක්විය යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැටුප, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ සඳහා 2020 අයවැය ප්‍රතිපාදනය රු. 66,100,000 ක් වුවත් එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු. 63,500,000 ක් ලෙස දක්වා තිබීම නිසා මුළු ඇස්තමේන්තුගත පුනරාවර්තන ප්‍රතිපාදනය රු.2,600,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වැටුප් වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ යටතේ විශේෂ නීති සේවා වියදම් වෙනුවෙන් ලද රු.2,600,000 ක අයවැය ප්‍රතිපාදන තාක්ෂණික දෝෂයක් හේතුවෙන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයෙහි වැටුප් වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ අවසන් එකතුවට ඇතුලත් වී නොමැත . නමුත් එම ප්‍රතිපාදනය ACA-(2i) ඇතුළු අනෙකුත් සියලු ආකෘතීන්හි නිවැරදිව ඇතුළත් කර ඇත. රු. 200,600,000 ක් වන විශේෂ නීති සේවා වියදම් වෙනුවෙන් ලද එම ප්‍රතිපාදන වැටුප් වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ ලෙස මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයෙහි දක්වා ඇති අගයට 2020 වර්ෂය සඳහා ලද අයවැය ප්‍රතිපාදන හා සමාන වේ. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කළ යුතුවේ. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතික වීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක. DMS/1021 Vol I හා 2017.07.18 දිනැති ලිපිය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා කාර්යය මණ්ඩලය අනුමත කර ඇත .නමුත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කටයුතු තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වා ගෙන යන බැවින් එහි ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකය මෙතෙක් පිහිටුවා නොමැත. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1ඡේදය යටතේ වන මාර්ගෝපදේශ අංක 06 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් පිළියෙල නොකර හරස් සටහන් මඟින් ලැබීම් හා ගෙවීම් ඉවත් කර පිළියෙල කර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 10.1 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 06 හි ඡේද අංක 06 යටතේ සඳහන් කර ඇති ඒ.සී.ඒ. - සී. ආකෘති පත්‍රය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත. අදාල ඡේදයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය "දළ පදනමින්" ලෙස සඳහන් කර ඇතත්, එයින් අදහස් කරන්නේ කුමක්ද, යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් හෝ නිර්වචනයක් ඉදිරිපත් කර නැත. කෙසේ වෙතත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කිරීමේ මූලික සිද්ධාන්තය වනුයේ තත්‍ය වශයෙන්ම ආයතනය තුළට ගලා ආ මුදල් සහ තත්‍ය වශයෙන්ම ආයතනයෙන් පිටතට මුදල් ගලා යාම් පදනම් කරගෙන එය පිළියෙල කිරීමයි. එහිදී මුදලින් නොවන ලැබීම් සහ ගෙවීම් (හරස් සටහන්, ජ´නල් සටහන් ආදිය මගින් ) ඉවත් කරනු ලබයි. අප විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ද මෙම ක්‍රමය අනුගමනය කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 2018/02 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලසුම සකස්කර නිපුණතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 ජනවාරි 24 දිනැති අංක 2018/02 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධි විධාන අනුව මේ වන විට මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහ ධාරිතා හා නිපුණතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර ඇති අතර ඊට අනුෂාංගිකව අනෙක් කටයුතු දැනට සිදු කරගෙන යමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

### 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වසර 03 කට වැඩි කාලයක සිට නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.185,000 ක ණය ශේෂයක් පැවතුණි. | මෙම ණය ශේෂය අයකර ගැනීම පිණිස මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක **PFD/RED/CJR/2019/04** හා ආයතන සංග්‍රහයේ අදාල ප්‍රතිපාදන ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | හිඟ ණය ශේෂය නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රු.2,500,000 ක් වටිනා Jaguar වර්ගයේ මෝටර් රථයක් අවුරුදු 03 ක කාලයක සිට නිශ්ක්‍රීයව තිබුණි. | "Jaguar" මෝටර් රථය අවස්ථා තුනකදී ටෙන්ඩර් කැඳවා විකිණීමට උත්සහ කළ ද ඒ කිසිදු අවස්ථාවකදී එහි තක්සේරු මිලට මිල ගණන් ඉදිරිපත් නොවුණි . එබැවින් ටෙන්ඩර් මණ්ඩල තීරණය අනුව එම රථය අලුත්වැඩියා කොට භාවිතා කිරීම හෝ නැවත තක්සේරු කිරීම යන දෙකෙන් වඩා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම පිළිබඳව නිර්දේශ ලබා ගැනීම පිණිස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහය ලබා ගැනීම | නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | |
|---|---|---|
| | සඳහා යොමු කර ඇත . 2020 වසරේ රටේ පැවති COVID වසංගත තත්ත්වය මත පැනවූ අගුළු ලෑම් ,ඇඳිරි නීති හා සංචරන සීමා හේතුවෙන් මෙම කටයුත්ත ඉටුකර ගැනීම ප්‍රමාද විය .කෙසේ වෙතත් එම රථය නැවත තක්සේරු කර විකිණීම යෝග්‍ය බවට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයෙකු විසින් 2021.02.10 දින සිය නිර්දේශය ලබා දී ඇති අතර ,මේ වන විට එය නැවත තක්සේරු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතී. | |

**3.2 කළමනාකරණ දුර්වලතා**

---------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණයට රු 5,000,000. ක ප්‍රතිපාදන ලබා දී තිබුණද ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ නොකිරීම නිසා ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. 2017 වර්ෂයේ සිට ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් වසර 03 කට වැඩි කාලයකසිට නිලධාරීන් තාවකාලික බහාලුම්වලින් සකස්කල ගොඩනැගිලිවල රාජකාරි කටයුතු සිදුකරමින් පැවතුණි. | අප කාර්යාලයට අයත් පැරණි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා එම පරිශ්‍රයෙහි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) තාක්ෂණික උපදේශනය යටතේ විවෘත තරඟකාරී ලංසු කැඳවීම මඟින් තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකු හරහා ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට 2020 මාර්තු මාසයේ දී කැබිනට් මණ්ඩල අනුමැතිය හිමි විය. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අංක NP/GOV/PP/JUS/20/07 දරන 2020/09/09 දිනැති ලිපිය මඟින් නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා එම වසර තුළදී අනුමැතිය ලබාදිය නොහැකි බව අප වෙත දන්වන ලදී .ඒ අනුව පැරණි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය විස්තරාත්මක ඇස්තමේන්තු සැකසීම පිණිස CECB ආයතනය වෙත දැනුම් දුන් නමුදු රටෙහි පැවති COVID-19වසංගත තත්ත්වය මත අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ පාලනයෙන් බැහැර කාරණා හේතුවෙන් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය . | ප්‍රතිපාදන මුදල් අදාල කාර්යයට යෙදවිය යුතුවේ. |

කෙසේ වෙතත් මේ වන විට ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු හා ඒ වෙනුවෙන්202 1 වසර තුළදී අප ලද ප්‍රතිපාදන අධිකරණ අමාත්‍යාංශය වෙත පවරාදී ඇති අතර අධිකරණ අමාත්‍යාංශය හරහා එකී කාර්යය ඉටු කරවා ගැනීමට කටයුතු යොදා ඇත.

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ තනතුරු 16 ක පුරප්පාඩු 77 ක් පැවති අතර තනතුරු 08 ක නිලධාරීන් 24ක් අතිරික්තව පැවතුණි . | අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව 117 ක් වන අතර 2020.12.31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 64 කි .එම නිලධාරීන් මඟින් දැනට පුරප්පාඩුව පවතින තනතුරු වල රාජකාරී කටයුතු ඉටු කරගැනීමට කටයුතු කර ඇත . කෙසේ වෙතත් සේවා අවශ්‍යතාවය අනුව ඇතැම් තනතුරු සඳහා අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් සිටින අතර එකී සේවා අවශ්‍යතාවය පිළිබඳ පුළුල් අධ්‍යනයක් සිදු කර තනතුරු සඳහා අවශ්‍ය වන සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගැනීමට අපේක්ෂා කරමු. සමස්ථ අධිකරණ පද්ධතියේම අධීක්ෂණය, මෙහෙයවීම සහ පරිපාලනය සිදු කරන අධිකරණ සේවා කොමිෂන් සභාවට අයත් එහි ලේකම් කාර්යාලය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යමින් අනුමත සේවක සංඛ්‍යාවටත් වඩා බොහෝ සෙයින් අඩු සේවක සංඛ්‍යාවකින් හා අවම පහසුකම් මධ්‍යයේ වුව ද කාර්යය මණ්ඩලය මනාව කළමනාකරණය කර ගනිමින් රාජකාරී කටයුතු සිදුකරගෙන යනු ලබන බව මෙහිලා විශේෂයෙන් සඳහන් කරමි. | කාර්ය මණ්ඩලය විධිමත් පරිදි පවත්වාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොළඹ මහාධිකරණයෙන් වැටුප් ගෙවන කාර්යාල කාර්ය සහායකයෙකු 2018 ජනවාරි සිට තාවකාලිකව කොමිසමේ සේවයට යොදවා ගෙන තිබුණි. | කාර්යාල සේවක සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 21 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව07 ක් වූ බැවින් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස කොළඹ මහාධිකරණයෙන් වැටුප් ගෙවන කාර්යාල සේවක සේවයේ සේවක මහතෙකු201 8 ජනවාරි 16 සිට ලබා ගැනීමට කටයුතු කර ඇත. අධිකරණ අමාත්‍යාංශය හරහා එම සේවක මහතා අප ආයතනය වෙත ස්ථිරව ස්ථානමාරු සිදුකරවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම 2020 වසරේ රටෙහි පැවති කොවිඩ් 19-තත්ත්වය හේතුවෙන් ප්‍රමාද විය. රටෙහි පවතින කොවිඩ් 19-වසංගත තත්ත්වය පහව ගිය පසු එම සේවක මහතා අප ආයතනය වෙත ස්ථිරව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ධාවන තත්ත්වයේ වාහන 04 ක් සඳහා රියදුරුවරුන් දෙදෙනෙක් පමණක් සේවයේ යොදවා තිබුණි. | අධිකරණ සේවා කොමිෂන් සභාව සතුව ධාවන තත්වයේ වාහන04 ක් පැවතියද රාජ්‍ය මුදල් මනාව කළමනාකරණය කරමින් රියදුරන් දෙදෙනෙකු මඟින් අදාල කාර්යයන් සිදු කර ගනු ලබන අතර මෙම වාහන 04 න් වාහන03 ක්ම අතිරික්ත වාහන පැවති භාණ්ඩාගාරය හා අධිකරණ අමාත්‍යාංශය මඟින් අප වෙත ලබා දුන් ඒවා වේ. එම වාහන අප ආයතනය විසින් රජයේ මුදල් වැයකර මිලදීගත් ඒවා නොවන බව අවධාරණය කරමි .තවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති රියදුරන් සංඛ්‍යාව 03ක් වන අතර දැනට රියදුරන් දෙදෙනෙකු පමණක් අප ආයතනයෙහි සේවය කරනු ලබයි .පුරප්පාඩුව පවතින රියදුරන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කිරීමට බලාපොරොත්තු වේ. | අවශ්‍යතාවය අනුව බඳවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |